

# ගමන (Elements – Earth, Water & Wind)

නිරාෂ ගුණසේකර

වසර හයකට නොඅඩු කාලයක් තිස්සේ මෙල්බර්න් හි දුවා දරුවන් ශ්‍රී ලාංකේය සංස්කෘතික දායාදයන් උරුම කරදෙන්නට වෙරදරන නර්තනායතනයකි 'තාල අසපුව - ශ්‍රී ලාංකේය නැටුම් පර්ෂදය'. එහි නිර්මාතෘ වන්නේ, අපේ සංස්කෘතික හර පද්ධතීන් රැකගන්න නිරන්තර අරගලයක යෙදෙන අපූරු කලාකරුවකු වන චලංක අතලගේ මහතායි. නුදුරු දින කිහිපයේදී කල එළි බැසීමට නියමිත, ඔහුගේ අලුත්ම සංස්කෘතිකාංගය 'ගමන' වෙනුවෙනි මේ සහෘද සටහන.

"මේ අපේ උරුම රැකදුන් පෙදෙසයි. මිනිස් ගණ ප්‍රමුඛ මහා වනස්පති හා නේක තුරු ලතා, දිය කඳුරු ඇළ දොළ, මහ පොළව, වැස්ස, සුළඟ, ඉර එළිය හා ගින්දර යන මෙකී නොකී සියලුම දෑ එකිනෙකා වෙත වෙලී ළංවී දැඩිව බැඳී හුන් පෙදෙසයි. එහෙව් අවකාශයක, ඔවුනොවුන් අන්‍යෝන්‍යව සුපෝෂණය වෙමින්, ඒ හා සමාන්තරවම ජීවිත කාලයක් මුළුල්ලේ එකිනෙකා මත ඇතිකළ බලපෑම සුළුපටු නොවේ. එය පහදා දීම අතිශය දුෂ්කර වුවද, එය අප විසින් ම අවබෝධ කරගත යුතු ආත්මීය සත්‍යයකි. බැඳියාවකි. මේ ඒ ආත්මීය බැඳීම් හරහා ඇවිද ආ ගමනේ කතාවයි...."

ඉහතින් දක්වා ඇත්තේ 'ගමන' සංස්කෘතිකාංගයේ තේමා පාඨයයි. මෙය කියවූ සැනින් අපගේ සිත් සතන් කිසියම් අතීතාවර්ජනයක් සමග මුසුවන්නේ නිසර්ගයෙනි. අප මෙතෙක් ආ මඟ තුළ එය විකාශනය වූ අයුරුත්, අප ලැබූ දියුණුවත් ඊට අමතරව සංස්කෘතියක් ලෙස අපගේ සාම්ප්‍රදායයන්, උරුමයන් නොනැසී රැක ගත්තේ කෙසේද යන කුහුලත් ඉන් ගම්‍ය වේ. ඒ අනුව 'ගමන' යනු තැන තැන දක්නට ලැබෙන සුලභ, තවත් එක් නර්තන ප්‍රසංගයක් නොවන බන අන්තර්ගත ඉංගිතයන් ගෙන් අපට වැටහී යනු ඇත. අපේ ජන විඥානයේ අදටත් සුරැකී පවතින උරුමයන් හා සංස්කෘතිකමය සභ්‍යත්වය ඉහළට ඔසවා තබන අපූර්ව නිමැවුමක් බවට 'ගමන' පවත්වන්නේ එබැවිනි.

චලංක අතලගේ මහතා පවසන පරිදි මේ සංකල්පය මුලින්ම ඔහුගේ හිතට ආවේ මීට අවුරුදු හට හතකට පෙරය. මෙය අපේ සිංහල සාරධර්ම උඩ ගොඩ නැගුණු වැඩසටහනක් බවත් කල්ප කාලාන්තරයකට පෙර නාග යක්ෂ ගෝත්‍රාදියෙන් ඇරඹිලා, අපේ අදිවාසීන් මුල් කරගෙන ඒ ඒ ස්වදේශීය සංස්කෘතීන් විකාශනය වූ අයුරින් මෙහි මූලිකම තේමාව වන්නේ. ඒ දේවල් පිළිබඳ ප්‍රාදේශීය මට්ටමට නොවැටී පුළුල් බැල්මක් ලන්න තමයි 'ගමන' උත්සාහ දරන්නේ. එහිදී අපේ පෞරාණික සිරිත් විරිත්, ගැමි ඇදහිලි හා නොයෙක් සංස්කෘතික අංග එකිනෙකා සමඟ සුසංයෝග වී ඇති සැටි ඔබට දැක ගන්න පුළුවන් වේවි.

'ගමන' කියන ප්‍රධාන තේමාවට යටින් දිවෙන පොළව, ගින්දර, ජලය හා සුළඟ වැනි ඒකකයන් මේ සංස්කෘතික කලා කටයුත්ත හා බද්ධ වන්නේ හරිම අපූරු ආකාරයකට. කිසියම් සංස්කෘතියක් ස්ථාපිත වන්න කලින් මිනිසුන් එකිනෙකා වෙත බැඳ තබන්නේ ස්වභාවධර්මය. අන්න ඒ බැඳීම ඇති නොවුණු තැනක සංස්කෘතියක් ගොඩ නැගෙන්න විදියක් නෑ. ඉතින් මෙහිදී මහ පොළොව, ගින්දර, ජලය හා සුළඟයන ප්‍රධානම පාදාර්ථයන් සතර මහඟු කාර්යභාරයක් ඉටු කරනවා ඒ ඒ ප්‍රජාවන්හි පැවැත්ම රැක ගැනීමට. 'ගමන' වැඩසටහනේත් සිව් සමා මූලද්‍රව්‍යයන් ලෙස මේ ස්වභාවික සම්පත් මුල්කරගෙන ඒ ඒ ඒකකයට අදාලව සුවිශේෂී නර්තනාංග වලින් අනූන අපූරු වැඩසටහනක් ගලා යන හැටි මෙල්බර්න් ඔබටත් දැකගන්න පුළුවන් වේවි. ඒ ස්වභාවික සම්පත් හි සුසංයෝගය, අපි ආ මේ ගමන තුළ කළ කාර්ය භාරය කොපමණදැයි කියා කලාත්මක වේශයකින් නිරූපණය කිරීම තමයි 'ගමන' අරමුණු කරන්නේ.

අද අප ජීවත් වන්නේ බහුවිධ සමාජයක. විදේශ රටක ජීවත්වන අප අතර විවිධ මුල් වලින් පැවත එන විවිධ සංස්කෘතීන්ට උරුමකම් කියන විවිධ විචිත්‍ර මිනිසුන් සිටිනවා. ඉතින් 'ගමන' කියන්ටන් ඒ විවිධ මූල පද්ධතීන් අමතක කොට කිසියම් ඒකමානික සංස්කෘතියක්, එනම් සිංහල සංස්කෘතිය ඔස්සේ පමණක් දිග හැරෙන කතන්දරයක් නොවේ. ලෝකේ කොහේ ජීවත් වුණත්, අන්තිම කෙළවරට ගිහින් බැලුවොත් සියළු දෙනාම පැවත එන්නේ එකම පාදමකින්. ඒක වශ්වීය සත්‍යයක්. එනිසා කුමන සංස්කෘතියක් ගත්තත්, එය ආසියාතික හෝ යුරෝපීය හෝ නැත්නම් ඕස්ට්‍රේලියාව වගේ මහද්වීපයකට අදාලද කියා වර්ගීකරණය වන්නට පෙර අප සියලු දෙනාම එකම මානවකයකුගෙන් පැවත එන්නන්. ඉතින් 'ගමන' තුළින් අපි මෙන්න මේ විශ්වීය සත්‍යය යම්තාක් දුරට ඔබට ඉදිරිපත් කරන්න උත්සාහ ගන්නවා. එය අපට ගෝචර විදියට ඉදිරිපත් කරනවා.

උදාහරණයක් විදියට, අපි යක්ෂ, නාග, වැදි ගෝත්‍රවලින් පැවත එන්නා සේම මෙහේ ජීවත් වන, මෙබිමේ මුල් පදිංචිකරුවන් පැවත එන්නේ ඇබොර්ජිනල් ගෝත්‍රය ඔ්සසේ. ඉතින් ජීවත් වීමේදී කොහේ කොතන හිටියත්, සංස්කෘතියක් ගොඩ නැගෙන ප්‍රාරම්භයේදී අපි කවුරුත් එකම ස්වභාවික සම්පත් පද්ධතියක් ඔස්සේයි හුස්ම ගන්නේ. ආහාර සොයා ගැනීම, දඩයම් කිරීම, අනතුරුව බව බෝග වගාව, ජනාවාස පිහිටුවා



ගැනීම, තම තමන්ට ආවේණික ඇදහිලි හා විශ්වාස ඔස්සේ ජීවිතය විශ්ලේෂණය කරගැනීම ආදී මෙකී නොකී සියල්ලම අතර එක්තරා පොදු සමානත්වයක් තියෙනවා. 'ගමන' ඔස්සේ, අබොර්ජිනල් ගෝත්‍රය හා අපේ ආදී වාසීන් අතර පැවතුණ අන්න ඒ සාමාන්‍ය මනාව නිරූපණය කරනවා.

නමුත් එය සිදුවන්නේ අපේ මහඟු වටිනා සම්ප්‍රදායන් මත පිහිටා ඒවා නොනැසෙන්න වග බලාගෙනයි. එහිදී මේ ද්විත්ත්ව සංස්කෘතීන් අතර සංකලනය ඔබට ගෙන හැර පාන්නේ අපේ පාරම්පරික සිංහල නර්තනංගයන් ඇසුරේයි. ඒඅ පගේ අවබෝධයට වඩාත් පහසු වන්නත්, අපේ සිතුම් පැතුම් හා හැඟීම්වලට දුරස් නොවී, දුරවබෝධ නොවී වඩාත් ම සමීප බවකින් ඔබට වින්දනයක් ලබා දීමටත්ය.

'ගමන' වැඩසටහන පුරාවටම එහි මූලික පදාර්ථයන් වන පොළොව, ගින්දර, ජලය හා සුළඟ යන පදාර්ථයන්ට දී ඇති තැන ඇති මහත්. ඒ ඒ ඒකකටන් මේ ආ ගමන තුළ මානවයා හා අවියෝජනීයව බැඳුණු හැටි නිරූපණය වන්නේ කදිම කලාත්මක සංස්කෘතික වේශයකින්. උදාහරණ විදියට මෙහි අන්තර්ගත 'පොල් රුප්පාව', 'මාදු ගඟ', 'අහිකුන්ඨක වාඩිය', 'ගිනි සිසිල', 'ඇඹුලේ රස', 'අම්බලමයි අම්බරුවයි', 'කොටහළු මඟුල හා සාජ්ජය', 'නවග්‍රහ පිහිටීම', 'ගැමි කෝලම', 'රූකඩ පෙට්ටිය' හා අවසාන වශයෙන් 'කදිර සුරිඳු උපහාරය' දැක්විය හැක. තාල අසපුවට සම්බන්ධ මෙල්බර්න් හි සිසු දරු දැරියන් සේම, නර්තන ක්ෂේත්‍රයේ ප්‍රාමාණිකයන් පවා මේ සංස්කෘතිකාංග ඉදිරිපත් කිරීම සඳහා දායක වනවා.

ඉදින් 'ගමනේ' සම්පත් පුද්ගල දායකත්වය මෙබඳුයි. සමහර කරුණු කාරනා තහවුරු කර ගැනීමේදී ප්‍රාමාණික ඇසුර ඉතා වැදගත් වුණ අතර 'ගමන' හි රංගන දායකත්වය දෙන 75කට නොඅඩු 'තාල අසපුවේ' සිසු දරු පිරිසට අමතරව ක්ෂේත්‍රයේ ප්‍රමාණිකයන් කිහිප දෙනෙකුත් සහභාගි වෙනවා. ඒ අතරින් ලාංකේය රංගන කලාවේ නමක් දිනූ, මෙල්බර්න් හි, ශ්‍රී ලංකා රංග නිකේතනයේ කුසුම්සිරි ලියනාරච්චි, යසෝදරා සරචන්ද්‍ර හා 'ගමන' වෙනුවෙන්ම ශ්‍රී ලංකාවේ සිට මෙහි පැමිණෙන, ශ්‍රී ලංකා නැටුම් පර්ෂදයේ සූසන්ත රූපතිලක, ප්‍රසන්න රූපතිලක හා සමන් මාතොට ආරාධිත ශිල්පීන් මතක් කළ යුතුයි. රාජ්‍ය නැටුම් කණ්ඩායම හා චිත්‍රසේන කලායතනය සමග ඒකාබද්ධව කටයුතු කර ඇති ඔවුන්ගෙන් පහත රට සාම්ප්‍රායික බෙර වාදන සඳහා ලැබෙන සහය අති විශාලයි. ඊට අමතරව නම් වශයෙන් නොකිව්වද 'ගමන' සඳහා නන් අයුරින් සහය දුන් විශාල පිරිසකුත් මේ පිටුපස සිටින බව මෙවැනි කර්යයක ඇති බරපතලකම වැටහෙන බවට ඔබට තේරුම්



යනු ඇත.

මේ වගේ සංස්කෘතිකමය වටිනාකමක් ඇති උත්සවයක් ඉදිරිපත් කරන එක ලෙහෙසි පහසු කටයුත්තක් නොවේ. ඒ සඳහා මනා හැදෑරීමත්, අපරිමිත චිත්ත ධෛර්යයකුත් අවශ්‍යයි. ඒ විතරක්ම මදි අපි කොහේ ජීවත් වුණත් අපේ ලේ නහර ඇතුළේ දුවන, ඒ අපේ සාම්ප්‍රදායික ජන විඥානයත්, සංස්කෘතිය හා අවියෝජනීයව බැඳුණු ඒ මානව බන්ධුතාත් අපට කිසිසේත් අමතක කරන්න බෑ. අන්න ඒ දේවල් සඳහා ඇති හෘදයාංගම ආදරය හා ගෞරවය නැතුව මෙවැනි දෙයක් කරන්න බෑ. තමන්ගේ මුල් විහිදුණු සංස්කෘතියට, සම්ප්‍රයදායට ආදරය කරනවා කියන්නේ ගතානුගතික මත කරපින්නා සිටීම යැයි වරදවා වටහා නොගත යුතුයි. මේ අපි 'ගමන' පුරාවට ම ඇත්තේ අන්න ඒ නිර්ව්‍යාජ ආදාරයම තමයි. අන්න ඒ හර පද්ධතීන් රැකගෙන ඒවා නොනසා සුභාවිත කලා කටයුත්තක් කිරීම කුමන ලෙසකින්වත් සරල කටයුත්තක් නොවන්නේ එනිසායි.

'ගමන' සහෘද ඔබ වෙනුවෙන් කල එළි දකින්නේ මැයි මස 9 වන සෙනසුරාදා, ඩැන්ඩිනොන්ග් හි ඩ්‍රම් තියටර් හිදීයි. ඔබේ පහසුවත් රසාස්වාදනයත් උදෙසා ප.ව. 2.00, ප.ව. 6.30 ලෙස දර්ශන වාර දෙකක් ම සූදානම් කර ඇති අතර ඔබට අවශ්‍ය ප්‍රවේශ පත්‍ර මිලදී ගැනීමට හා ආසන වෙන්කරවා ගැනීමට නන්දන - 0433 86- 045, නන්දසිරි - 0430 048 648, පවිත්‍රා - 24321 188 905 හා තුසිත - 0412 184 428 ඇමතිය හැකියි. අපි විශ්වාස කරනවා අපේ සංස්කෘතියට හා කලාවට ආදරය කරන සියළු දෙනාම මේ සද්කාර්යය සඳහා එක සිතින් එදාට එක් රොක් වෙයි කියා.

අවසාන වශයෙන් 'ගමන' සංස්කෘතික කලා කටයුත්තේ නිර්මාතෘ, චලංක අතලගේ මහතා ඔබ සියළුදෙනා වෙනුවෙන් කියන කතාවකින් මේ සටහන අවසන් කරන්නේ එදාට ඔබ සියළු දෙනාම බැහැදැකීමේ අපරිමිත ආදරයකින් හා බලාපොරොත්තුවකිනි.

"අපි අපේ සංස්කෘතියට, සම්ප්‍රදායට හා අපේ වටිනා හර පද්ධතිවලට ආදරෙයි. අපේ ඇට මිදුළුවල පවා ඒ දේවල් කැටිවෙලා තියෙනවා. ඒවා තමයි කැකෑරි කැකෑරි නිර්මාණාවේශය ලබල නැවත නැවතත් උපදින්නේ. 'ගමන' සංකල්පය මුලින්ම මගේ හිතට එනකොටත්, එදා මෙදා තුර සියළුම නර්තනාංග නිර්මාණය කරන කොටත්, අන්න ඒ පදනමේ පිහිටා කටයුතු කරන්නට, ඒ වටිනා සම්පත් නොනැසෙන්න වග බලාගන්නට මට හැකි සියළුම උත්සාහයන් මම ගත්තා. මේ නිර්මාණ ක්‍රියාවලිය තුළ විශ්වීය මිනිසෙකුට පෙදු වූ සමානත්වයක් ගැන කතා කළද, මෙහි එන සියළුම රඟ දැක්වීම් ගොඩ නැගෙන්නේ අපේ උඩරට පහතරට නැටුම් සම්ප්‍රදායයන් ඇසුරේ. වෙන්ත් සංස්කෘතිවලින ණයට ගත් කිසිවක් මෙහි අඩංගු නෑ. අපේ ම දෙයක් විදියට මෙය ඔබට



තිළිණ කළොත් තමයි මෙය වැඩිපුරම අපට දැනෙන්නේ. අපේ හෘදය සාක්ෂිය අවදි වන්නේ. මෙය නිකන්ම නිකන් නර්තන ප්‍රසංගයක් නොවේ. නර්තනය මෙහි ප්‍රකාශ මාධ්‍යය විතරයි. මේ තුළින් කියවෙන්නේ අපේම කතාවයි. මම හිතනවා ඔබ සියළුදෙනාම එදාට ඒ වෙනස් අත්දැකීම ලබන අතරතුර 'ගමන'සමඟ ආත්මීයව, ආධ්‍යාත්මිකව බැඳී උසස් රසවින්දනයකට පසු ලබන නිරාමිස සුවයක් අත්කර ගනී කියා. එන්න එදාට, අපි අපේම 'ගමන' ගැන, මගහැරුණු තැන ගැන නැවතත් ආවර්ජනය කරමු. ස්තූතියි !"